25 වන පිටෙන්

කේමදාසයන් ජෝති වෙනුවෙන් කළ ගී නිර්මාණ අතරින් කිහිපයක්.

මා ප්‍රාර්ථනා අශාවෝ ආරාධනා ඇසුනාදෝ
පෙර ආත්මයේ පැතුවාදෝ මේ ආත්මයේ
හමුවේදෝ

චිත්‍රපට පසුබිම් ගායකයෙක් ලෙස ජෝතිපාලයාණන් මුල්වරට තම කටහඬ අවදි කළේ නැසීගිය සිරිසේන විමලවීරගේ පොඩි පුතා සලෙරුව සදහායි. ඔහු එම ගීතය පටිගත කිරීම් සඳහා ගායනා කළේ මහත් අභිමානයෙනි. නමුත් ඉන්දියානු චිත්‍රපට රචකයා ජෝතිපාලයාණන්ගේ හඬ ගැන සතුටු නොවීය. ඔහුගේ හඬ පොඩි පුතා චිත්‍රපටය සදහා භාවිතා කිරීම පිළිබඳ ඔහු විමලවීරයාණන්ට දොස් නැගුවේය. "අයිසේ ළමයාත්ව තමුසෙගේ හඬ දෙදුරුම් කනවා. හරියට එන්නේ නෑ. මට ඇහෙන්නේ තමුසේ සින්දු කියන හඬක් නෙවේ ගොරවන හඬක්.." සිරිසේන විමලවීරගේ එම වදන් ජෝතිගේ දෑසට කදුළු එක කිරීමට සමත් වෙනවා. චිත්‍රපට පසුබිම් ගායකයකු වීමේ මුල්ම සිහිනය එසේ බොඳ කරන ලද විමලවීර විසින් "මේ ලෝකේ නවාතැන" නම් වූ එම ගීතය ගැයීම සඳහා සිසිර සේනාරත්න යොදා ගනු ලබනවා. එහෙත් ඒ කිසිවක් ජෝතිපාලයාණන් දැන නොසිටියේය. පොඩි පුතා චිත්‍රපටය, ප්‍රදර්ශනය සදහා මුද්‍රාහැරිය විට තමාගේ ගීතයක් ද එම චිත්‍රපටයේ ඇති බව මහත් අභිමානයෙන් මිතුරු සමාගම් සමග පැවසූ ජෝතිපාලයාණන් ඔහුගේ සගයන් ද පිරිවරා ගෙන චිත්‍රපටය නැරඹීමට සිනමා ශාලාවට ගියෝය. එහෙත් සිදුවූයේ ඔහු බලාපොරොත්තු වූ දෙයක් නොවේ. තමා ගායනා කළ ගීතය එහි ඇතුළත් නොවන බව දුටු ඔහු ඉන් මහත් පසුතැවිල්ලටත්, ලැජ්ජාවටත් පත් වූ ඔහු මිතුරන් ඉදිරියේ අසරණ විය. නියත ලෙසම ගායකයෙක් ලෙස තම ජීවිතය හැඩ ගස්වා ගත යුතු බව දැඩිව සිතට ගත්තේ මේ අවස්ථාවේදීය. එකී අධිෂ්ඨාන ශක්තිය ඔහුගේ ගායන ජීවිතය එළිපෙහෙළි කිරීමට සමත් වූ බව පිළිගත හැකි සත්‍යයකි. පසුව සුරතලී චිත්‍රපටයේ නිෂ්පාදක ජබීර් ඒ කාදර් මහතාට ජෝතිපාලයාණන්ව තමාගේ චිත්‍රපටයට යොදා ගැනීම සඳහා ඔහුගේ ගීතයක් ඇසීමට අවශ්‍ය විය. එහිදී ජෝතිපාලයාණන්ට ගීතයක් පටිගත කිරීම සඳහා ප්‍රමාණවත් මුදල් අතේ නොමැති විය. ඒ අවස්ථාවේදී කෘතහස්ත සංගීතවේදී ස්ටැන්ලි ඔමාර් මහතා රුපියල් 35ක විශාල මුදලක් ජෝතිපාලයාණන්ට පරිත්‍යාග කිරීමට පොහොසත් විය.

අමර පෙම් ලතාවේ (සදහටම ඔබ මගේ), පාට පොදක් තිලකලා (කස්තුරි සුවඳ), හද විමන් දොරින් (කස්තුරි සුවඳ), සල් සපු නා (සංගීතා), ලෝකයේ වෙනස් වුණේ (සංගීතා), පායන දේදුනු (වානරයෝ), තනියේ ආවාරේ (චණ්ඩි පුතා), බඹරා වගේ (චණ්ඩි පුතා), සරා සඳේ (මිහිදුම් සිහින), සිහින අහසේ (නැවත හමු වෙමු) ඇතුළු තවත් ගී රැසක් සරත් දසනායකයන්ගේ තනු නිර්මාණයෙන් ජෝතිගේ සුමියුරු හඬට මුසු වෙනවා. වැඩි ප්‍රමාණයක් යුග ගී වන අතර ඒවාට ගායනයෙන් දායක වූයේ ඇන්ජලින් ගුණතිලකයි. වැඩියෙන් පසුබිම් ගායනා කළේ විජය කුමාරතුංගටය.

කෘතහස්ත සංගීතවේදී ස්ටැන්ලි ඔමාර්ගෙන් එදා පන්නරය ලැබූ ජෝතිගේ 1987 ජූලි 03 ගම්උදා වේදිකාවේ පිටුපස සිටියේ සිටියේ සහ සංගීතය මෙහෙයුවේ කෘතහස්ත සංගීතවේදී ස්ටැන්ලි පීරිස්ය.

පෘතුගීසී කාරයා රටවල් අල්ලන්න සූරයා
හතුරු රාජ මාරයා මුළු ලෝ හොල්ලන්න වීරයා

අපේ අම්මා විතරක් නොව හේමා ආර්යාවද අත්පුඩි තලද්දී බුද්දක කැරකිලා දෙකට නැමිලා නැටුවා මතකයි. පෘතුගීසී කාරයා ගීතය සමග ජෝති සිනමා පසුබිම් ගීත කලාවේ හිණිපෙත්තට නැග්ගේය. සුනිල ශාන්ත, අරිසෙන් අහුබුදු ශූරින් සහ ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතා සංදේශය චිත්‍රපටය සඳහා ඔහු තෝරා ගත්තේය. ජෝති අන්කල් ආමාරුවෙන් රාජ කිරුළු පලන්දාපු රජ්ජුරුවෝ ගයලා ප්‍රේමදාස උන්නැහේ දිහා බලලා කිව්වේ මං ආවේ අපේ රජාණෝ නිසාවෙන් කියාය. ඇත්තටම ප්‍රේමදාස උන්නැහේ කලා කරුවන් ගැන හොඳින් හොයලා බැලූවා ලූ. ඒ ඔහුගේ අවසන් ප්‍රාසංගික වේදිකාව බව මගේ ඇස් දෙක දැනගෙන සිටියේ නැත.

පාළු සුසානේ ප්‍රේම පුරාණේ කඳුළු විලාපේ මා
තමයි
අප දෙදෙනාගේ එදා සෙනෙහේ සැමරුම්
කිසිදා මැකී නොයේ
මට අමතක නෑ ඔබට මතක නෑ....

අප හදවත් නැළ වූ මේ ආශ්චර්යමත් ගීත කෝකිලයා 1987 ජූලි 07 වැනි දා අප දෙනෙත් හඬවා භෞතිකව නික්ම ගියද හේ තබාගිය නිර්මාණ තවමත් අප හදවත් නළවයි. ඒ අය අතරින් ජෝති කියන්නේ සිනමා පසුබිම් ගායනයේ එක යුගයක්. ඔහු සිනමා සංගීතයේ පුරාවෘත්තයක් බඳුයි. ඒ අඩුව සම්පූර්ණ වන දවසක් මට මගේ දිවිය තිබෙන තෙක් දකින්න ලැබේදැයි සැක සහිතයි. ජෝතිපාලට පින් සිදු වෙන්නට ඔහු විසින් ගායනා කරන කල ගීත ගයා ප්‍රසංග වේදිකාවල, ගායනා තරගවල, බස්වල කී දෙනෙක් මුදල් හම්බ කරනවාද?

**"ලංකාවේ එක් ගායන ශිල්පියෙක් ඉන්නවා. ඔහුගේ නම ජෝතිපාල, ඔහුගේ ඇතැම් ගීත මම අහලා තියෙනවා. මේ ලංකාව ඔහුට පුංචි වැඩියි. ඔහු ඉපදිය යුතුව තිබුණේ ලංකාවේ නෙවෙයි මහා භාරතයේයි. එහෙම කිවුවේ මොහොමඩ් රාෆියි.**

හිටිය ජෝතිට වඩා මියගිය ජෝති ප්‍රබලයි. ඔබයි අංක එකේ ආදේශක නැති, සුපිරිම සුපිරි තරුව,

**ජෝති ඔබට නිවන් සුව...**




## මහින්ද ගුණවර්ධන

## වැඩ සහ ආහාර

හියකුජෝ චීනයේ ජීවත් වූ චාන් (සෙන්) ගුරුවරයෙක්. වයස අවුරුදු අසූව පිරුණට පස්සෙත් එතුමා සිසුන් සමග ගෙවත්තේ වැඩට සම්බන්ධ වුණා. උදලු ගෑවා, ගස් කප්පාදු කළා. අතුපතු ගෑවා. වියපත් ගුරුතුමා මහන්සි වී වැඩ කරන සැටි දුටු සිසු දරුවෝ දුක් වුණා. එහෙත් ඔහුට කිව්වාට අහන්නේ නැති බවත් ඔවුන් දැන සිටියා. දවසක් ඔවුන් සාකච්ඡා කළා. තීරණය කළා. ගුරුතුමාගේ මෙවලම් හැංගුවා.

එදා ගුරුතුමා ආහාර ගත්තේ නෑ. දෙවැනි දවසෙත් නිරාහාර ව සිටියා. තුන්වන දවසේත් ඒ විදියට කුසගින්නේ සිටියා.

"අපි මෙවලම් සැඟවූ නිසා එතුමා කේන්තියෙන් ඇති. අපි ඒවා ආපහු දෙන එක ගුණ යි."

මෙවලම් ආපසු ලැබුණු පසු ගුරුතුමා සුපුරුදු විදියට ආහාර ගත්තා. එදා සවස සිසුවන්ට උපදේශයක් දුන්නා.

"වැඩ කරන්නේ නැත්තම් ආහාර නෑ."


